"සුළඟ එනු පිණිසයි" චිත්‍රපටයේ එන දර්ශන අලලා විග්‍රහයක් කිරීමට බලාපොරොත්තු නොවෙමි. මන්ද. ඒ සම්බන්ධව පුවත්පත් ගණනාවක නිසි සේ විස්තර සපයා ඇති නිසාය. මේ චිත්‍රපටයේ අපේ ගැමි සංස්කෘතියට පහර ගසා ඇති අන්දම දුටු විට විමුක්ති ජයසුන්දර සිංහලයෙක්දැයි ත්‍රස්තවාදියාටද පුදුම සිතෙනු නිසැකය. විමුක්ති ජයසුන්දර වාසය කරන ප්‍රංශ රටේ වුවද ගර්භනී මාතාවක් හා ප්‍රසිද්ධියේ රමනයේ යෙදීම කුඩා දැරියක් ඒ දෙස බලා සිටීම වැනි දේ සිදුවේ යැයි සිතීම පවා අසීරුය. එසේ නම් මොවුන් මෙවන් දර්ශන අපේ සමාජයට ඇද ගනිමින් සනාථ කරන්නට තනන්නේ කුමක්ද?

යුද්ධය සිනමාව සහ දේශද්‍රෝහියෝ!

මා කුඩා කල නැරඹූ සුනිල් දත් සහ නාර්ගීස් රඟපෑ 'මදර් ඉන්දියා' නම් වූ චිත්‍රපටය මාගේ මතකයේ තවමත් රැඳී ඇත. තම ස්වාමිපුරුෂයා මියගිය පසු විවිධ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ, කාමාතුරයන්ගෙන් මිදී, පතිවත රකිමින් තම පුතුන් දෙදෙනා පෝෂණය කරන මව, සමාජය විසින්ම සොරකු බවට පත් කරන ලද තම බාල පුතණුවන් තරුණියක බලහත්කාරයෙන් ගෙන යාමට තැත් කරද්දී වෙඩි තබා මරා දමන්නීය. ඇය තම පණවන් පුතු ඝාතනය කරනුයේ සාරධර්ම, සදාචාරය, විනය රැකීම උදෙසාය. චිත්‍රපටය අවසන් වන්නේ ඇය පසු කලෙක 'භාරත මාතාව' නමින් විරුදාවලිය ලබන දර්ශනයෙනි. කඳුළු පෙරාගෙන මදර් ඉන්දියා නරඹන සමහරුනට නාර්ගිස් වීරවරියක් වී ඇතැයි කියන පිරිසක්ද අප අතර සිටිති. නමුත් මෙහෙබූබ් ඛාන් විසින් අධ්‍යක්ෂණය කරන ලද, ඉන්දියා ධජය ප්‍රදර්ශනය කරමින් ඇරඹෙන මෙම චිත්‍රපටය හොඳම විදේශීය චිත්‍රපටය ලෙස ලෝ පසිද්ධ ඔස්කා සම්මානය සඳහා ද යෝජනා වූ අතර, එහි ප්‍රධාන චරිතය රඟපෑ නාර්ගිස්ට කාලෝවිවෙරි චිත්‍රපට උළෙලේ ප්‍රථම ජාත්‍යන්තර සම්මානය සහ තවත් විදේශීය සම්මාන රැසක්ද හිමි විය. ජාත්‍යන්තර සම්මාන රැසකින් පිදුම් ලත් එම චිත්‍රපටය තුළින් ඉන්දිය සිනමා කලාකරුවා ඉන්දිය කාන්තාව සහ සදාචාරය රැක ගැන්ම සඳහා ඉන්දියානුවන්ගේ තිබෙන කැපවීම ගැන ලොවට දෙන පණිවිඩය කොතරම් උතුම්ද?

'බෝඩර්' නමැති හින්දි චිත්‍රපටයෙන් පෙන්වන්නේ හතුරු මායිමේ ඉන්දිය සෙබළුන් මවුබිම බේරා ගැනීමට නිර්භීතව සටන් කරන, රට වෙනුවෙන් දිවිපුදන ආකාරයයි. ඔවුන්ගේ බිරියන් ඔවුන් වෙනුවෙන් කැපවන, කඳුළු සලන ආකාරයයි. නරඹන්නන් සිනමා හලෙන් පිටවන්නේ තම මාතෘභූමිය ගැන සෙබළා ගැන, සෙබළ බිරිය ගැන දැඩි ගෞරවයක්, භක්තියක් සිත්හි දරාගෙනය.

1991 වර්ෂයේ ඇමරිකානුවන් ඉරාකයේදී යුධ වදිද්දී සිදුවූ මාගේ හිතට කාවැදුණු එක් සත්‍ය සිද්ධියක්ද මෙහි ලා ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. ඇමරිකන් සොල්දාදුවන් ඉරාකයේ සටන් වදින විට ඇමරිකාවේ නිව්යෝක් නගරයේ එරට ඉතාමත් ජනප්‍රිය ඇමරිකන් පාපන්දු අවසාන තරගය පැවැත්විණි. දස දහස් ගණනක් ඇමරිකානුවෝ තරගය නැරඹීමට පාපන්දු ක්‍රීඩාංගණයට රැස්ව සිටි අතර, ලක්ෂ සංඛ්‍යාත ඇමෙරිකානුවන් පිරිසක් රූපවාහිනිය වෙත නෙත් යොමා සිටියහ. ඉරාකයේද, සටන් වදිමින් සිටි ඇමරිකානු සොල්දාදුවන්ගෙන් බොහෝ දෙනා කඳවුරුවල සිට තම හද බැඳගත් එම තරගය රූපවාහිනිය මගින් නැරඹීම සඳහා සැදී පැහැදී සිටියහ. තරගයේ ප්‍රධාන අමුත්තා ජනාධිපති බුෂ් වූ අතර, තරගය ආරම්භ වී විවේක කාලය එළඹුණු මොහොතේ ජනාධිපති බුෂ් තම අසුනින් නැගිට මයික්‍රොෆෝනය ළඟට විත් ජනතාව ඇමතීය.

'අද අප ඇමරිකානුවන් සියලු දෙනා මෙම තරගය නරඹමින් ප්‍රීති වෙමු. නමුත් ඇමරිකානු ධජය රැක ගැනීම සඳහා දිවි කැප කරමින් අප වෙනුවෙන් සටන් වදින අපේ සහෝදර සහෝදරියන් පිරිසක් විදේශීය රටක මේ වේලාවේ සිටින බව මොහොතකටවත් අප අමතක කර නැහැ. එම රණවිරුවන් කෙරෙහි අප හදවතේ ඇති ගෞරවය දැක්වීමට කෙරෙන උපහාරයකි මේ.'

ජනාධිපති බුෂ් එසේ පවසා අදුන්ගත වූ විගස ඉතා මිහිරි සංගීතයක් ඇරඹිණි. ක්‍රීඩාංගණයේ මහා දොරටු සියල්ල විවෘත විය. විවෘත වූ දොරටු තුළින් ඉතා අලංකාර ලෙස ඇඳ පැළඳගත් කුඩා දරු දැරියන් සිය ගණනක් ක්‍රීඩා පිටියට දිව ආහ. ප්‍රීතියෙන් උද්දාමයට පත් වූ ඒ ළමුන් සියලු දෙනා හටම බොහෝ තෑගි ලැබිණි. මේ ළමෝ කවරහුද? ඔවුනු සියලු දෙනාම ඒ මොහොතේ ඉරාකයේ යුද වැද සිටින ඇමරිකානු සොල්දාදුවන්ගේ දූ පුතුන් වූහ. දහස් ගණනක් නරඹන්නන් තම අසුන්වලින් නැගිට අත්පොළසන් දෙමින් එම දරු දැරියන්ට ආචාර කරන මොහොතේ ඉරාකයේ ඇමරිකන් හමුද කඳවුරක රූපවාහිනිය මගින් එම දර්ශනය බලා සිටි ඇමරිකානු සොල්දාදුවකුගේ නෙතඟින් කඳුලක් කඩා හැලෙන දැක්වෙන කදිම ඡායාරූපයක් පසුදින පුවත් පතක පළවී තිබෙනු මා දුටිමි. එය දුටු මාගේ නෙතටද කඳුලක් නැගුනේ රටක ජනතාව තමන් වෙනුවෙන් දිවි පුදන සොල්දාදුවනට ගෞරව කරන අන්දම මට පෙනී ගිය නිසාද නැතහොත් වෙනත් කරුණක් නිසාදැයි මා තවම නොදනිමි.

මා ඉහත සඳහන් දේ ඉදිරිපත් කලේ සිනමාව රටක අභිමානය නැංවීමට සහ සෙබළාගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීමට යෙදූ ආකාරයත් එමෙන්ම රටක සමස්ත ජනතාවම සෙබළාට තම ගෞරවය පුද කරන ආකාරයත් පෙන්වීමට උදහරණ ලෙසිනි.

ලොව යුද්ධය ගැන කෙරුණු සිනමා කෘතීන් කොතෙකුත් අප දැක ඇත. එවන් සාර්ථක නිර්මාණ කළ සෑම දෙනකුම පාහේ ඒවා බිහිකිරීමට ප්‍රථම අදාල යුද්ධය ගැන ගැඹුරින් හදාරති. ඒ ඒ ස්ථානවලට ගොස් පෞද්ගලික අත්දැකීම් ලබති. එසේ ගොස් සිටියදී සතුරු ප්‍රහාරවලට ලක්ව මියගිය කලාකරුවන් ගැන ද අපි අසා ඇත්තෙමු. අපේ කලාකරුවන් ද, යුද්ධය, සෙබළා, සෙබළ බිරිඳ අලලා සිනමා කෘති කරත් නම් ඔවුන්ද යුධ පිටියට ගොස් සෙබළා හා කතා කළ යුතුය. සෙබළ බිරින්දෑත් සමඟ සාකච්ඡා කළ යුතුය. සෙබළා විඳින දුක මුහුණ පාන රාජකාරී සහ පෞද්ගලික ගැටලු පිළිබඳව හැදෑරිය යුතුය. මෙතෙක් කල් යුද්ධය ගැන සිනමා කෘතීන් කල කලාකරුවන්. සතුරා පෙනෙන තෙක් මානයේ ඉඳි වූ බංකරයක සෙබළුන් රාජකාරී කරන ආකාරය දැක බලා ඇත්නම් වැසි කාලයේ බුට් සපත්තුවල වතුර රැඳී තැම්බුණු පා ඇඟිලි සහිතව නිල ඇඳුම පවා සෝද වේලා ගැනීමට නොහැකිව, වාහන මඩේ එරීම හේතුවෙන් නිසි වේලාවට ආහාර පවා නොමැතිව සිටියදීත් නොපිරිහෙලා සිය රාජකාරීන් කරන අන්දම සියැසින් දුටුවා නම් උන්මත්තකයකු සේ හැසිරෙන ලිංගික හැඟීම් පමණක් උතුරා ගිය අසංවර, නොහික්මුණු මනෘකල්පිත සෙබළෙකුගේ චරිතයක් තිරයේ මවන්නේ නැත. සටන් බිමේදී වර්ධනය වන කණ්ඩායම් හැඟීම, සහෝදරත්වය පිළිබඳ අවබෝධයක් ඇති කරගත්තේ නම් මියගිය සෙබළා දැවෙන සෑයෙන් සිගරට්ටුවක් දල්වන දර්ශන ඇතුළත් කරන්නේද නැත. එසේම සෙබළ බිරිඳ, සෙබළා වෙනුවෙන් කරන උදර කැපවීම ගැන පැහැදිලි වැටහීමක් තිබුණේ නම් සෙබළ බිරියන්ගේ ආත්ම ගෞරවයට හානි කරන කිසිදු නිර්මාණයක් ඔවුන් අතින් බිහි වන්නේ ද නැත.

සවනට මිහිරිතම වදනක් වූ 'අම්මා' යන්න තේමාව කරගෙන චිත්‍රපටයක් සාද එහි මවද සම්බන්ධකොට අනන්තවත් කුනුහරුප අන්තර්ගත කළහොත් කුමක්වේද? එම චිත්‍රපටයේ තාක්ෂණය කොතරම් උසස් ලෝක මට්ටමේ පැවතුනද එයට සම්මානයක් ලබාදීමේදී ජාත්‍යන්තර විනිශ්චය මණ්ඩලයක් වුවද මදක් පැකිලෙනු නිසැකය. මන්ද 'අම්මා' යන්න විශ්ව තේමාවක් බැවිනි. කුමන මාදිලියේ අම්මා කෙනකු වුවද ඇය ලෝක චාරිත්‍රයට අනුව ජගත් ප්‍රජාවගේ ගෞරවයට පාත්‍රවන භක්තිමත් සංකේතයක් වන බැවිනි. එවන් සිනමාවකට සම්මානයක් දීමෙන් සම්මාන දෙන්නන්ගේ අම්මාවරුනටද නිග්‍රහයක් වන බැවිනි. චිත්‍රපටයට තාක්ෂණය මෙන්ම එහි අන්තර්ගත තේමාවද අතිශය වැදගත් වනුයේ එබැවිනි. මවට ගරු කරන්නා මවු බිමටද ගරු කරයි. මවු බිමේ ඉරණම බොහෝ දුරට තීරණය වන, ඉතා සංවේදී මාතෘකාවක් තේමා කරගෙන සිනමාවක් කරන්නේ නම් එයින් තම මවුබිමට අගෞරව නොවන පරිදි බොහෝ දුර දිග බලා කටයුතු කළ යුත්තේ [illegible] කලාකරුවා. එය තමන්ගේ කලා කුසලතාවයට කරන සීමා පැනවීමක් සේ නොසිතයි. කලාකරුවාගේ සදාචාරය එයයි. මෙය තමන්ට සීමා පැනවීමක් සේ යමෙක් සිතයිද ඔහු තම මව සම්බන්ධයෙන්ද කුණුහරුප යොද නිර්මාණ කිරීමට පසුබට නොවනු ඇත.

අප රටේ යුද්ධය අලලා නිර්මාණය කර ඇති නවතම සිනමාව 'සුළඟ එනු පිණිස' චිත්‍රපටයයි. ප්‍රංශයේ චිත්‍රපට කලාව හදරා ප්‍රංශයේ ජීවත් වූ විමුක්ති ජයසුන්දර මෙම චිත්‍රපටයට ප්‍රංශ සම්මානයක් පිරිනැමූ උත්සවයේදී කියා ඇත්තේ මෙය යුද්ධයත් නැති සාමයත් නැති වකවානුවක අප රටේ මිනිසුන්ගේ ජීවන තත්ත්වය පිළිබිඹු කිරීමක්ය යනාදී වශයෙනි. නමුත් චිත්‍රපටයෙන් ඔහු පෙන්වන අදාල ජීවන තත්ත්වය යථාර්ථවාදී නොවන බව මේ වන විටත් බොහෝ විචාරකයින් පෙන්වාදී ඇත. මෙම චිත්‍රපටය නැරඹීමේදී අපට ඉතාම පැහැදිලි වන්නේ අනෙකුත් යුද සිනමා කලාකරුවනට මෙන්ම විමුක්ති ජයසුන්දරටද යුද්ධය පිළිබඳ නිර්මාණ කරන විට සංසර්ගයෙන් තොර ජීවිතයක් නැති බවය. ක්‍රියාන්විත පෙදෙසකට ජීවිතයට පය නොතබා රණබිමක්, බංකරයක් යනු කුමක්දැයි නොදක, සෙබළ ජීවිතය සේම ගම ආරක්ෂා කරන ග්‍රාමාරක්ෂකයාගේ දිවි පැවැත්ම ගැනද කිසිදු අධ්‍යයනයක් නොකර ප්‍රංශයේදී පිටපත ලියා වෙනත් කොන්දේ රූපගත කරන්නාවූ මෙවන් චිත්‍රපටවල එකම කාර්යභාරය වන්නේ සිංහල ජනතාව, සිංහල සෙබළා සහ සිංහල සංස්කෘතිය ලෝකයා ඉදිරියේ දරුණු ලෙස පහත් තත්ත්වයට ඇද දැමීමයි. ඒ තුළින් ත්‍රස්තවාදියා විසින් සිංහලයා යනු අමන ජාතියක් යනුවෙන් ලොව පුරා ගෙන යන දුෂ්ඨ ප්‍රචාරයට සෘජුවම මුක්කු ගැසීමයි.

රියර් අද්මිරාල් සරත් වීරසේකර

'සුළඟ එනු පිණිසයි' චිත්‍රපටයේ එන දර්ශන අලලා විග්‍රහයක් කිරීමට බලාපොරොත්තු නොවෙමි. මන්ද. ඒ සම්බන්ධව පුවත්පත් ගණනාවක නිසි සේ විස්තර සපයා ඇති නිසාය. මේ චිත්‍රපටයේ අපේ ගැමි සංස්කෘතියට පහර ගසා ඇති අන්දම දුටු විට විමුක්ති ජයසුන්දර සිංහලයෙක්දැයි ත්‍රස්තවාදියාටද පුදුම සිතෙනු නිසැකය. විමුක්ති ජයසුන්දර වාසය කරන ප්‍රංශ රටේ වුවද ගර්භනී මාතාවක් හා ප්‍රසිද්ධියේ රමනයේ යෙදීම කුඩා දැරියක් ඒ දෙස බලා සිටීම වැනි දේ සිදුවේ යැයි සිතීම පවා අසීරුය. එසේ නම් මොවුන් මෙවන් දර්ශන අපේ සාමජයට ඇද ගනිමින් සනාථ කරන්නට තනන්නේ කුමක්ද? මෙහි ගම්බද අහිංසක කාන්තාව විලිබිය නැති පදුරු ගානේ එක එකා හා සංවාසයේ යෙදෙන ගැහැනියක් සේ හුවා දක්වන අතර, සිංහල සෙබළා යනු විනයක්, හික්මීමක් නැති, මිතුරාගේ බිරිඳ අපහරණය කරන අණක් ගුණක් නැති නරුමයකුසේද පෙන්වයි. එසේම හමුදාව විසින් මිනිසුනට වද හිංසා පැමිණවීම, තිරශ්චීන ලෙස මරා දැමීමට අණදීම වැනි දේ පෙන්වන මෙම චිත්‍රපටයේ තම බිරිඳ සමඟ වුවද එකට නිද නැරඹීමට නොහැකි ඉතා පහත් පෙළේ ලිංගික දසුන් ඇතුළත්ව තිබේ. මෙයින් අපට පෙනී යන්නේ විමුක්ති ජයසුන්දර ප්‍රංශයේදී සිනමාව හදරන අතර වෙනත් දේවල්ද උපරිම ලෙස හදරා ඇති බවයි. පිට රැටියන් මොහුට සම්මාන ප්‍රදානය කර ඇත්තේ විමුක්ති ජයසුන්දර ඉපදුන රටේ පවතින අශිෂ්ට සංස්කෘතිය ස්වකීය නිර්මාණ තුළින් ලෝකයට පෙන්වීමට තරම් 'ආත්ම ශක්තියක්' ඔහු තුළ තිබෙනු බැව් සිතූ නිසා විය යුතුය. [illegible] ජාතිය වුවද [illegible] සුදානම්ව සිටින පුද්ගලයා ප්‍රාන්ක් ස්වල්පයකට තම වැදූ මවු වුවද අලෙවි කිරීමට පසුබට නොවනු ඇත.

රටේ පුරවැසියන් ලෙස අපේ මවුබිම සුරක්ෂිත කිරීමට අපි සියලු දෙනාම බැඳී සිටිමු. රට දෙකඩ කරන ත්‍රස්තයා හා පවතින යුද්ධයේ අවසාන ප්‍රතිඵලය මුළුමහත් සමස්ත ශ්‍රී ලාංකික ජනතාවටම බලපානු බැව් සත්‍ය නම් ත්‍රස්තවාදියකු නොවන රටේ සෑම වැසියෙක්ම යුද්ධය ජයග්‍රහණය කිරීම සඳහා සෘජුවම හෝ වක්‍රව දායක විය යුතුය. ඔවුන් අතරින් සෙබළා යුද්ධයට සෘජුවම දායක වෙයි. රටේ නිෂ්පාදනයට විවිධ අයුරින් සහාය වෙමින්ද රජයට බදු මුදල් ගෙවමින්ද රජයේ සහ පෞද්ගලික අංශයේ පුද්ගලයන් යුද්ධ නිසා අද වැටෙන ආර්ථිකයට උරදී යුද්ධයේ ජයග්‍රහණයට වක්‍රව දායක වෙයි. එසේ නම් රටේ කලාකරුවාගෙන් ඒ සඳහා විය යුතු සේවය කුමක්ද? යුද වදින සෙබළාගේ චිත්ත ධෛර්ය වඩවන, ත්‍රස්තවාදය හෙළා දැක්වෙන ප්‍රවණතාවයක් මතු කරවන, ත්‍රස්තයාට තියෙන ජාත්‍යන්තර අනුකම්පාව අංශුමාත්‍රයකින් හෝ අඩුකරන නිර්මාණයක් බිහි කිරීම නොවේද? එසේ බැරිනම් මොකුත් නොකර සිටීම වෙනුවට රටේ මුළු ජනතාවම යුද්ධය ජයග්‍රහණය කිරීමට සෘජුව/වක්‍රව දායක වෙද්දී, යුද්ධය අලලා රටට වින කරන ත්‍රස්තවාදය වක්‍රව සාධාරණීය කරන නිර්මාණයක් බිහිකොට ලෝක ප්‍රජාවට පෙන්වන්නේ නම් එම පුද්ගලයා අපේ මාතෘ භූමිය සුරක්ෂිත කිරීමට බිහි වූ සුජාත පුරවැසියෙක්ද නැතහොත් දේශද්‍රෝහියෙක්ද?

අද රටේ පවතින යුද්ධය හෝ සටන් විරාමය හෝ ගැන මෙලෝ හසරක් නොදැන යුද්ධය පිළිබඳ නිර්මාණ කිරීමට යැමෙන් මෙවන් කලාකරුවන් විසින් රටට විශාල හානියක් සිදු කරමින් සිටී. අප යුද වදින්නේ දෙමළ ජනතාව සමඟ නොව ත්‍රස්තවාදීන් සමඟය. මේ ත්‍රස්තවාදීන් අතරේ සිංහලයෝද වෙති. ත්‍රස්තයෝ සිංහල, මුස්ලිම් ජනතාව පමණක් නොව තම මතවාදයට එරෙහි වන අහිංසක උගත් දෙමළ ජනයාද අමු අමුවේ මරා දමති. සාමාන්‍ය අර්ථ දැක්වීම අනුව ත්‍රස්තවාදය යනු දේශපාලන අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා අහිංසක සිවිල් ජනතාව ඝාතනය කිරීම සහ රජයේ දේපළවලට හානි පැමිණවීමයි. ලෝකයේ භයානකම ත්‍රස්තවාදීන්ගේ ලැයිස්තුවේ අපේ රටේ ත්‍රස්තයෝ මුල් තැන ගෙන ඇත්තාහ. උන් අප මවුබිමෙහි උතුරු නැගෙනහිර වෙනම රාජ්‍යයක් බවට පත්කිරීමේ දේශපාලන අරමුණින් ත්‍රස්තවාදයට පිවිස ඇති අතර ඔවුන් එය ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ සාධාරණීය කරනුයේ කෙසේද? ලංකාවේ බහුතර 'සිංහල' ජාතිය දෙමළ සුළු ජාතිය පාගා මර්දනය කරමින් සිටින බවත්, සිංහල ජාතිය යනු සාරධර්මයන්ගෙන් තොර සදාචාරයක්, සංස්කෘතියක් නැති වනචර ජාතියක් බවත්, සිංහල සොල්දාදුවා යනු දෙමළ තරුණියන් දුටු දුටු තැන දූෂණය කරන විනයක්, හික්මීමක් නැති නූගත් අමනයෙක් බවත් තහවුරු කරන ඉතා සූක්ෂම ලෝක ප්‍රචාරක කටයුතු මගිනි. මෙවන් දීන ප්‍රචාර තුළින් ලෝක ප්‍රජාව ඒ ලෙස දැනුවත් කර, එමගින් තමනට තමන්ගේ විමුක්තිය උදෙසා ත්‍රස්තවාදය හැර වෙන විකල්පයක් නොමැති බව ඒත්තු ගැන්වීම එහි එකම අරමුණයි. ලොව පිළිගත් උගත් නායකයකු වූද, අප රටේ ත්‍රස්තවාදයට විරුද්ධව ලොව පුරා මතයක් ඇති කළා වූද, දෙමළ ජාතිකයකු වූ කදිර්ගාමර් මැතිතුමා කිවූ දෙයක් මෙහි ලා දැක්වීමට වටී. 'ත්‍රස්තවාදීන් යනු ත්‍රස්තවාදීන්ය. ත්‍රස්තවාදය ඇති වීමට හේතුන් කවරෙක් වුවද ත්‍රස්තවාදය කිසිසේත්ම සාධාරණීය කළ නොහැක' යනුවෙනි. ත්‍රස්තවාදීන් විසින් වටිනා මනුෂ්‍ය රත්නයක් වූ කදිර්ගාමර් මහතාද මෑතකදී ඉතා මිලේච්ඡ අයුරින් ඝාතනය කළද, අන්තර් ජාතික ප්‍රජාව ලංකාවේ ත්‍රස්තයනට එරෙහිව තහංචි දැමීමට මෙතෙක් දැඩි ලෙස ඉදිරිපත් වීමට තවමත් පැකිලෙන්නේ ත්‍රස්තයන් විසින් ජාත්‍යන්තරව ඉතා ශක්තිමත් ලෙස ස්ථාපිත කොට ඇති 'සිංහලයන්' පිළිබඳව ඇති කරන ලද එම 'විචිකිච්ඡාව' නිසාය.

මෙවැනි තත්ත්වයක් මත සිංහලයාට ගරහන, සිංහල ජාතිය පාවා දෙන, සිංහල සෙබළා හෙළාදකින සිංහල කාන්තාවට නිග්‍රහ කරන සිනමා කෘතීන් බිහිකොට ලෝකයට ඉදිරිපත් වේ නම් ත්‍රස්තයන්ගේ ඉහත කී දීන ප්‍රචාරක වැඩසටහන්වලට එය සෘජුවම දායක වීමක් වනු නොවේද? සොල්දාදුවන් ලෙස මෙහිදී අප ඉදිරිපත් වන්නේ එයට විරුද්ධව මිස චිත්‍රපට විචාරකයන් ලෙස නොවේ. රටේ දැවෙන ජාතික ප්‍රශ්නයක් වන ජාතියට සෘජුවම බලපාන යුද්ධය අරභයා සිනමා කෘතියක් කරන විට එය දෑ හිතකාමී එකක්ම විය යුත්තේ එබැවිනි. මන්ද දෑයට වින කරන නිෂ්පාදනයන්ගෙන් ත්‍රස්තවාදීන්ට වාසියක් සැලසෙන බැවිනි. විශේෂයෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ දිගහැරෙන සිනමා කෘතියක තේමාව අප රටේ යුද්ධය නම්, යුද්ධය මවුබිමේ තීරණාත්මක අංශයක් වන තරමටම ඉතා සංවේදී නම්, දේශයට හිතැති පුරවැසියන් වන සැවොම එම සිනමා කෘතිය තුළින් බලාපොරොත්තු වන්නේ මවුබිම කෙරෙහි 'හිතකර' ප්‍රතිරූපයක් නැංවීම බැව් නොරහසකි.

සොල්දාදුවන් ලෙස අප යුද්ධයට සෘජුවම සම්බන්ධ වන නිසා සිනමා කෘතියක හෝ තේමාව යුද්ධය වන විට අප වඩා සැලකිලිමත් වන්නේ එබැවිනි. යුද්ධයට මුහුණ දීමට සහ ජීවිත පරිත්‍යාගයෙන් නිර්භීතව ඉදිරියට යැමට තරම් මානසික තත්ත්වයක් සෙබළ මුළුව තුළ සැමවිටම රැඳවීමේ පූර්ණ වගකීම අපසතු බැවිනි. විශේෂයෙන්ම සටන් විරාම කාලය තුළ හමුදාව භෞතික සහ මානසික මට්ටමෙන් ශක්තිමත්ව සිටීම, ත්‍රස්තයන් විසින් නැවත යුද්ධයකට අවතීර්ණවීම වැළැක්වීමට බොහෝ දුරට හේතු පාදක වන බැවිනි. එවන් වූ සෙබළුන්ට සැමවිටම දිරි දෙන සෙබළ බිරින්දෑන් සිටීම අපට අවශ්‍ය බැවිනි. මෙහිදී උක්ත සිනමාවේ කැමරාකරණය, අධ්‍යක්ෂණය, සිනමාකෝණ අපට වැදගත් නොවේ. අපට වැදගත් වනුයේ ඒ තුළින් දෙන පණිවිඩය හමුදාවට බලපාන අන්දමයි. නමුත් අවාසනාවක මහත රටේ ආරක්ෂක තත්ත්වය ගැන සති පතා මහා විග්‍රහයක යෙදෙන කීර්ති වර්ණකුලසූරිය මහතා අපේ යුද සිනමාව ගැන කියා ඇත්තේ මෙසේය. 'වෙනත් රටවල් ගැන සලකා බලන විට සිය මවුබිම බිහිසුණු ත්‍රස්තවාදයෙන් බේරා ගැනීමට තම වර්තමානයත් අතීතයත් පූජා කරන සෙබළුනට එරෙහිව චිත්‍රපට නිපදවන ලෝකයේ එකම රට වී ඇත්තේ ශ්‍රී ලංකාව' බවය. විසිදහසකට අධික සංඛ්‍යාවක් මවුබිම ආරක්ෂා කිරීමට ජීවිත පූජා කර තිබියදීත් තව ඒ හා සමාන සංඛ්‍යාවක් සදාකාලික ආබාධිතයන්ව සිටියදීත් සෙබළුන්ගේ මානසික මට්ටම නැංවීමට, ඔවුන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීමට එබඳු සිනමා කෘතීන් මෙතෙක් නිර්මාණය නොවීම ඇත්තටම නම් ප්‍රශ්නයක්ද? එම තත්ත්වය ඉදිරියේ අප හැඩිය යුතුද සිනාසිය යුතුද දැයි මට නොතේරේ.

'සුළඟ එනු පිණිසයි' චිත්‍රපටය නිෂ්පාදක එම චිත්‍රපටයට ජාත්‍යන්තර සම්මානයක් ලබා ගැනීම සම්බන්ධයෙන් කර ඇති ප්‍රකාශයක් මෙහි ලා දැක්වීම වැදගත් යයි සිතමි. 'අපේ රටේ සංස්කෘතියේ සදාචාරයේ, අනන්‍යතාවයේ හරි මොකක් හරි එකක හරි සීගිරිය සංකේතයක් නම් ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණයක් කළ මෙම චිත්‍රපටය ඉතිහාසය තුළ ඒ තරම් සමාජ මුද්‍රාවක් බවට පත්වෙනවා' යනුවෙනි. රටේ සංස්කෘතිය සහ සදාචාරය සමහරෙකුට මොකක් හරි එකක් වුවද සුජාත දේශප්‍රේමී පුරවැසියනට නම් එය මහඟු ආභරණයකි. ඉතිහාසයට, සංස්කෘතියට, සභ්‍යත්වයට ගරු නොකරන්නා තම මවට සහ පියාටද ගරු නොකරයි. එවන් පුද්ගලයන් හඳුනාගත් විට ජාතියේ මතු යහපත සඳහා ළමා පරපුර ඔවුන්ගෙන් ඈත් කිරීමට සියලු මවුවරු සහ පියවරු වග බලා ගත යුතු වෙති. එසේම ජගත් ප්‍රජාවගේ දැඩි ගෞරවයට පාත්‍ර වූ, සිංහල කලාකරුවා අතින් බිහි වූ, ලොව අග්‍රගණයේ විශ්ව කලා මංජුසාවක් වූ සීගිරියට යන මාවත දෙපස ඇති තුන්හිරි ගසක් සෙලවීමට තරම් හෝ පණක් මේ 'සුළඟට' නොමැති බව සියල්ලෝ දනිති.

අවසාන වශයෙන් මෙම චිත්‍රපටයේ වර්තමාන සාඩම්බර නිෂ්පාදක බවට පත්ව සිටින සන්නස්ගල මහතා කියා ඇත්තේ 'මේ චිත්‍රපටය හදලා තියෙන්නේ ඇහට නොව ඔලුවට' යනුවෙනි. සන්නස්ගල හෝ විමුක්ති හෝ වෙන කවරෙක් හෝ නරඹන්නාගේ ඔලුවට නොව ශරීරයේ වෙන ඕනෑම අවයවයකට බලපාන අයුරින් චිත්‍රපට නිෂ්පාදනය කිරීම අපට ප්‍රශ්නයක් නොවේ. එවන් චිත්‍රපට බැලීම/නොබැලීම, වාරණය කිරීම/ඉඩදීම පිළිබඳ අයිතිය ජනතාව සතුය. නමුත් රටේ දැවෙන ජාතික ප්‍රශ්නයක් වන ත්‍රස්තවාදීනට එරෙහිව කරන 'යුද්ධය' අරබයා යමෙක් චිත්‍රපටයක් නිෂ්පාදනය කරයිද ඒ තුළින් නරඹන්නාගේ ඔලුවට යන දේ ගැන ඉහත දක්වා ඇති පරිදි අපට ඇත්තේ විශාල ප්‍රශ්නයකි. එම නිෂ්පාදනයෙන් ජාතිය පාවාදී සෙබළා අමනයෙක් කොට සෙබළ බිරිඳ වෛශ්‍යාවක් කරමින් ත්‍රස්ත ප්‍රචාරක කටයුතුවලට උඩගෙඩිදී ඇත්නම් එම චිත්‍රපට නිෂ්පාදකවරයාගේ ඔලුව පරීක්ෂා කළ යුතුය. එසේ පරීක්ෂාකොට ඔහු සිහිමද ගතියෙන් පෙළෙන්නේ යැයි තහවුරු වුවහොත් ඔහුගේ ඊළඟ නිෂ්පාදනයට පෙර ඔහුට මනෝ වෛද්‍ය ප්‍රතිකාර ලබාදිය යුතුය.

ඔහු එය මනා සිහි බුද්ධියෙන් යුතුව කර ඇත්නම් එය පැහැදිලිවම දේශයට ද්‍රෝහි වීමක් සේ අපි දකිමු. මන්ද පෙර විස්තර කර ඇති පරිදි එයින් වක්‍රව හෝ රටේ ත්‍රස්තවාදය සාධාරණීය කිරීමට රුකුල් දෙන නිසාය. දේශද්‍රෝහීන්ට දණ්ඩ නීති සංග්‍රහයට අනුව සෑම රටකම මෙන්ම ලංකාවේද දෙන එකම දඬුවම මරණීය දණ්ඩනයයි. ජාතියේ පැවැත්ම උදෙසා එවැන්නෙක් දුටුතැන වහාම අත්අඩංගුවට ගෙන අදාළ නීතිමය කටයුතු කොට අවසානයේදී රටේ නීතියට අනුව එල්ලා මැරිය යුතුය.